# ආණ්ඩුවේ නිවේදන

## කන්න රැස්වීම් තීරණ ප්‍රකාශයට පත් කිරීම

පදවිය මහා වාරිමාර්ග ව්‍යාපාරය

1994 අංක 13 දරණ වාරිමාර්ග ( සංශෝධන ) පනත යටතේ පිහිටුවන ලද පදවිය මහා වාරිමාර්ග ව්‍යාපාරයේ 2020 යල කන්නය සදහා **"විශේෂ ව්‍යාපාර කළමණාකරණ කමිටු වගා රැස්වීම"** 2020.04.23 දින පදවිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී පැවැත්වූ අතර එහිදී 2020 යල කන්නයේ වගා කටයුතු සදහා පහත සදහන් වගා කාලසටහන හා යෝජනා සම්මත කරන ලදී.

**2019/20 මහ කන්නයේ වගා කාල සටහන**

1. වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය - අක්කර 4500 ( වී අක්කර 3000 ක් හා අතිරේක බෝග අක්කර 1500 )

| | ගොවි සංවිධානය | වගා කරන ඩී ඇලවල් | තිබෙන අක්කර ප්‍රමාණය |
|---|---|---|---|
| උඩ ඇල | මහසෙන් | ඩී 1 සිට ඩී 6 දක්වා | 435 |
| | අරුණ | ඩී 7 | 367 |
| | විජයබා | ඩී 8 ,ඩී 9 | 547 |
| | ගජබා | ඩී 14 , ඩී 15 | 200 |
| | මෛත්‍රී | ඩී 10 | 372 |
| යට ඇල | පන්ඩුකාභය | ඩී 1 , ඩී2 , ඩී 3, ඩී 4 | 470 |
| | විමුක්ති | ඩී 5, ඩී 6 | 300 |
| | යාය 5/6 | ඩී 7 , ඩී 9 | 207 |
| | යාය 6 දුටු ගැමුණු | ඩී 10 | 150 |
| | අභය | ඩී 18 සිට ඩී 20 | 500 |
| | ඉසුරු | ඩී 21 සිට ඩී 27 | 435 |
| | සේවා | ඩී 15 ආර්.බී 5,6,7 | 200 |
| පහළ ඇල ඩී 11 ඇල හා ඩී 15 ඇල අතිරේක බෝග සදහා සුදුසු ඉඩම් තොරාගෙන අක්කර 300 ක් පමණ ලබා ගැනීම හා උඩ ඇලේ අතිරේක බෝග සදහා සුදුසු කුඹුරු ප්‍රමාණවත් නොවූ නිසා ඩී 12 හා ඩී 11 විවෘත්ත කර අතිරේක බෝග සදහා යොදා ගැනීම. ( 2020.05.05 දින පැවති විශේෂ බෙත්ම කමිටුවේ තීරණ මත ) | | | |

| අනු අංකය | කාරණය | විස්තරය |
|---|---|---|
| 01 | වගා කිරීමට යෝජිත බෝග වර්ග | වී සහ අතිරේක බෝග ( බඩ ඉරිඟු,සෝයා, රටකජු,මුං,කව්පි,එලවළු හා අනෙකුත් බෝග |
| 02 | ගොවීන් විසින් ඇලවල්වල නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය | 2020.04.23 |
| 03 | බෙත්ම කමිටුව විසින් බෙත්ම බෙදා අවසන් කල යුතු දිනය | 2020.04.23 |
| 04 | ගොවීන් විසින් ඇලවල් වල නඩත්තු නොකරන ඇලවල් ගොවි සංවිධාන විසින් නඩත්තුව අවසන් කල යුතු දිනය | 2020.04.26 |
| 05 | ගොවි සංවිධාන හා වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන ඇළ සහ බෙදුම් ඇලවල් කෙත් ඇලවල් සහ දිය බස්නා ඇලවල්වල නඩත්තු කටයුතු අවසන් කළ යුතු | 2020.04.28 |

| | | |
|---|---|---|
| | දිනය | |
| 06 | මුල් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2020.04.28 |
| 07 | බීජ හෝ පැල සිටුවා අවසන් කළ යුතු දිනය | 2020.05.18 |
| 08 | මුර ජලය ආරම්භ වන දිනය | 2020.05.20 ( අතිරේක බෝග සඳහා ගැලපෙන ලෙස කාලසටහන සදා ජලය නිකුත් කල යුතුය ) |
| 09 | අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2020.08.09 |
| 10 | වගාව රක්ෂණය කර අවසන් කළ යුතු දිනය | 2020.05.18 |
| 11 | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | 2020.08.28 |
| 12 | අස්වනු නෙලා අවසන් කිරීමට යෝජිත දිනය | 2020.08.28 |

බෙත්ම හිමිකාරිත්වය පහත පරිදි වේ.

I. ලොට් අංක හිමි වාරිමාර්ග ඇල මාර්ග මගින් ජලය ලබා ගන්නා නීත්‍යානුකූල ඉඩම් හිමියන්ට වී වගාව සඳහා අක්කර 01 බැගින් හා අතිරේක බෝග සඳහා අක්කර ½ බැගින් ලබා දිය යුතුය.

II. ලොට් අංක හිමි ගොඩ ඉඩමක් ඇති නමුත් කුඹුරු ඉඩම් නොමැති අය සඳහා වී වගාව සඳහා අක්කර ½ ක් ලබා දිය යුතු අතර අතිරේක බෝග සඳහාද අක්කර ½ ක් ලබා දිය යුතුය.

III. ඉඩම් බෙදීම සඳහා වෙන්කරනු ලබන බල ප්‍රදේශය තුළ රක්ෂිත වගා කරුවන් , අමුණු වලින් ජලය ලබා ගන්නා, පහත් ජලය ලබා ගන්නා අයගෙන් ඉඩම් බෙදීම සඳහා ලබා ගත යුතු අතර ඒ සඳහා වී වගාව සඳහා අක්කර ½ ක් හා අතිරේක බෝග සඳහා අක්කර ½ ක් ලබා දිය යුතුය.

IV. අංක 01 යටතේ හෝ අංක 02 යටතේ බෙත්ම ලැබූ අය සඳහා අංක 03 යටතේ ඉඩම් නොලැබෙන අතර ඔවුන් සතු ඉඩම් බෙදීම් සඳහා ලබා ගත යුතුය.

**සම්මත වූ අනෙකුත් නීති හා රෙගුලාසි**

1. අතිරේක බෝග සඳහා බෙදා වෙන් කරන ලද ඉඩම් වල වී වගා කිරීම සම්පූර්ණයෙන් තහනම්ය.
2. කෙත් ඇලවල් හා බෙදුම් ඇලවල් නඩත්තුව සඳහා අක්කරයකට රු.300.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.
3. නියමිත දිනට බෙදුම් ඇලවල් සහ කෙත් ඇලවල් වල තම කොටස නඩත්තු නොකරන ගොවීන්ගෙන් බඹයකට රු.250.00 ක් අය කිරීම. (පළමු වතාවට හා දෙවන වතාවට)
4. අමතර ජලය නිකුත් කිරීමක් කරනු නොලැබේ.
5. ගවයින් ඇතුළු කිරීම තහනම්.
6. ඇලවේළි / නිර්මිත හෝ වාරි පද්ධතියේ උපාංගවලට හානි කරන පුද්ගලයන් නීතිය හමුවට පැමිනවීම වාරිමාර්ග ආඥා පනතේ 23 වෙනි වගන්තිය ප්‍රකාරව ගොවි සංවිධාන වෙත බලය පවරා ඇති අතර එකී පනතේ viii කොටසේ 93 වෙනි වගන්තිය අනුව වැරදිකරුවන් දඩුවමට ලක්වනු ඇත.
7. වාරි ජලයට අපද්‍රව්‍ය / විෂ ද්‍රව්‍ය එක් කරන තැනැත්තන් සම්බන්ධයෙන් 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 84 ( 1 ) වගන්තිය ප්‍රකාරව වරදකරුවන් නීතිය හමුවට පැමිණවීමට ගොවි සංවිධානයේ නියෝජිතයින් හට බලය පවරා ඇත.
8. මෙම කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම ගොවි සංවිධානය වෙත පවරා ඇති අතර ගොවි සංවිධානය වෙනුවෙන් ක්‍රියා කරන ගොවි නියෝජිතයින් හෝ ජල පාලකවරුන් රාජකාරියෙහි නියැලෙන විට බාධා කිරීමක් , ඉඩ නොදීමක් , පරිභව කිරීමක් හෝ හිංසා කිරීමක් සිදු කිරීම , රාජකාරියට බාධා කිරීමේ වරදට වරදකරුවේ. ( ඒ සඳහා වාරිමාර්ග ආඥා පනතේ 95 වැනි වගන්තිය හා 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 72 වගන්තිය ප්‍රකාරව නීතිමය රැකවරණ සළසා ඇත.
9. මෙම නිවේදනයේ යම් සඳහනක් පිළිබඳව අර්ථ නිරූපන බලය අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් සතුය.

ආර්.එම්.වන්නිනායක,

දිසාපති/ දිස්ත්‍රික් ලේකම්

අනුරාධපුර දිස්ත්‍රික්කය

ආර්.එම්. වන්නිනායක
දිසාපති/දිස්ත්‍රි... ...ලේකම්
අනුරාධපුර.